# උසස් මූල්‍ය ගිණුම්කරණය

## [AA21]

### 01 වන පරිච්ඡේදය සඳහා වූ අතිරේකය

# මූල්‍ය ගිණුම් පාලනයන් ක්‍රියාත්මක කිරීම

මෙම අතිරේකයට අන්තර්ගත කොට ඇත්තේ 01 වන පරිච්ඡේදයේ
1.6 අනු මාතෘකාවේ සිට ඉදිරියට ඇති විෂය කරුණු පමණි.
මෙම අතිරේකයට අමතරව ග්‍රන්ථයේ අන්තර්ගත 'මූල්‍ය ගිණුම් පාලනයන්
ක්‍රියාත්මක කිරීම' යන 01 වන ඒකකයේ 1.1 සිට 1.5 දක්වා වන
අනු මාතෘකා යටතේ ඇති විෂය කරුණු 2019 ජනවාරි විභාගයේ සිට
ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා අදාළ වේ.

පරිච්ඡේදය 01

## 1.6 මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම

බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී පහත පියවර අනුගමනය කළ හැකිය.



මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමේදී පහත සඳහන් හේතු පමණක් අදාළ කරගනී.

| මුදල් ගිණුමට හර කරන අයිතම | මුදල් ගිණුමට බැර කරන අයිතම |
|---|---|
| ▪ බැංකුවට සෘජුවම ලැබී ඇති ප්‍රේෂණ<br>▪ ව්‍යාපාරයේ ගනුදෙනු වාර්තා කිරීමේදී සිදු වී ඇති වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළ යුතු හර කිරීම් | ▪ බැංකු විසින් ජංගම ගිණුමෙන් අඩු කරගෙන ඇති ස්ථාවර නියෝග මත කළ ගෙවීම්<br>▪ අය කළ ගාස්තු, චෙක්පත් ගාස්තු, අයිරා පොලී<br>▪ ව්‍යාපාරයේ ගනුදෙනු වාර්තා කිරීමේදී සිදු වූ වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීමට කළ යුතු බැර කිරීම් |

මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීමෙන් පසු, බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙළ කරනු ලබයි. එහිදී මුදල් ගිණුමේ සංශෝධිත ශේෂයට,

- එම කාලය තුළ බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම එකතු කළ යුතුය.
- එම කාලය තුළ නිශ්කාෂණය නොවූ චෙක්පත්වල වටිනාකම් අඩු කළ යුතුය.
- බැංකුව විසින් ගනුදෙනු වාර්තා කිරීමේදී සිදු වී ඇති වැරදි සහ අඩුපාඩු සුදුසු පරිදි එකතු කිරීම හෝ අඩු කිරීම කළ යුතුය.

ගැළපීම්වලින් පසු බැංකු ප්‍රකාශනයේ සඳහන් වටිනාකම ලැබේ.

මුදල් ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා බැංකු සැසඳුම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේ ආකෘති පහත සඳහන් පරිදි වේ.

**මුදල් පාලන ගිණුම / මුදල් ගිණුම (සංශෝධිත)**

| | රු. | | රු. |
|---|---|---|---|
| ඉ/ගෙ/ශේෂය | XXX | සටහන් නොවූ ස්ථාවර නියෝග මත ගෙවීම් | XXX |
| සටහන් නොවූ සෘජු ප්‍රේෂණ | XXX | බැංකු ගාස්තු | XX |
| අගරු වූ නිකුත් කළ චෙක්පත් | XX | චෙක්පත් ගාස්තු | X |
| තැන්පත් කළ චෙක්පත්වල අගය අඩුවීම | X | අගරු වූ තැන්පත් කළ චෙක්පත් | X |
| | | සටහන් නොවූ නිකුත් කළ චෙක්පත් | X |
| | | ශේ/ප/ගෙ | XX |
| | XXX | | XXX |
| ඉ/ගෙ/ශේෂය | XX | | |

**........................................ බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ / මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය | | XXX |
| **එකතු කළා:** | | |
| ඉදිරිපත් නොවූ චෙක්පත් | XX | |
| බැංකු ප්‍රකාශනයේ සිදු වී ඇති වැරදීම් | XX | XX |
| | | XXX |
| **අඩු කළා :** | | |
| නිශ්කාශණය නොවූ චෙක්පත් | XX | |
| බැංකු ප්‍රකාශනයේ සිදු වී ඇති වැරදීම් | XX | (XX) |
| (2) | | |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | **XXX** |

## Eg: උදාහරණ :

විමල් ව්‍යාපාරයේ 2018 අප්‍රේල් මාසයට අදාළව මුදල් ලැබීම් ජර්නලය හා මුදල් ගෙවීම් ජර්නලය පහත දැක්වේ.

**මුදල් ලැබීම් ජර්නලය**

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් (රු.) | වටිනාකම (රු) | විශ්ලේෂණ තීරු (රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | ණයගැති ලැබීම් | අත්පිට විකුණුම් |
| 04.05 | විකුණුම් | 258696 | - | 16,000 | - | 16,000 |
| 04.08 | කුමාර | 329680 | 500 | 10,000 | 10,000 | - |
| 04.10 | විකුණුම් | - | - | 5,000 | - | 5,000 |
| 04.15 | මේදා | 523981 | 800 | 12,000 | 12,000 | - |
| 04.20 | සහන් | 352822 | 300 | 8,000 | 8,000 | - |
| 04.22 | රන්දික | 392931 | 700 | 15,000 | 15,000 | - |
| 04.25 | සාලින්ද | - | 1,000 | 19,000 | 19,000 | - |
| | | | **3,300** | **85,000** | **64,000** | **21,000** |

## මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක් අංකය | ලද වට්ටම් (රු) | වටිනාකම (රු) | විශ්ලේෂණ තීරු (රු) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ණයහිමි ගෙවීම් | අත්පිට ගැනුම් | වියදම් | වෙනත් |
| 04.04 | ගැනුම් | 322020 | - | 6,000 | - | 6,000 | - | - |
| 04.06 | සේපාල | 322021 | 500 | 15,000 | 15,000 | - | - | - |
| 04.08 | විදුලිය | 322022 | - | 6,000 | - | - | 6,000 | - |
| 04.12 | කෝසලා | 322023 | 1,000 | 18,000 | 18,000 | - | - | - |
| 04.18 | සුළු මුදල් | 322024 | - | 2,000 | - | - | - | 2,000 |
| 04.25 | ගැනිලි | 322025 | - | 5,000 | - | - | - | 5,000 |
| 04.28 | ගෙවල්කුලී | 322026 | - | 6,000 | - | - | 6,000 | - |
| 04.29 | ගැනුම් | 322027 | - | 4,000 | - | 4,000 | - | - |
| | | | **1,500** | **62,000** | **33,000** | **10,000** | **12,000** | **7,000** |

## මුදල් පාලන ගිණුම / මුදල් ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| 4/1 | ඉ/ගෙ ශේෂය | 12,000 | | ණයහිමි පාලන ගිණුම | 33,000 |
| | ණයගැති පාලන ගිණුම | 64,000 | | ගැනුම් | 1,000 |
| | විකුණුම් | 21,000 | | වියදම් | 12,000 |
| | | | | වෙනත් ගෙවීම් | 7,000 |
| | | | 4/30 | ශේෂය ප/ගෙ | 44,000 |
| | | **97,000** | | | **97,000** |
| 5/1 | ශේෂය ඉ/ගෙ | 44,000 | | | |

2018 අප්‍රේල් මාසය සඳහා බැංකුවෙන් ලද ගිණුම් ප්‍රකාශනය පහත දැක්වේ.

### 2018 අප්‍රේල් මාසය සඳහා බැංකු ප්‍රකාශනය

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 04.01 | ශේෂය | - | 12,000 | 12,000 |
| 04.08 | චෙක් 258696 | - | 16,000 | 28,000 |
| 04.10 | චෙක් 322020 | 6,000 | - | 22,000 |
| 04.10 | මුදල් | - | 5,000 | 27,000 |
| 04.12 | චෙක් 322021 | 15,000 | - | 12,000 |
| 04.15 | චෙක් 523981 | - | 12,000 | 24,000 |
| 04.16 | චෙක් 322023 | 18,000 | - | 6,000 |
| 04.18 | චෙක් 322024 | 2,000 | - | 4,000 |
| 04.20 | චෙක් 218570 | - | 10,000 | 14,000 |
| 04.25 | චෙක් 322025 | 5,000 | - | 9,000 |
| 04.25 | මුදල් | - | 19,000 | 28,000 |
| 04.30 | චෙක් 322026 | 6,000 | - | 22,000 |
| | චෙක්පොත් ගාස්තු | 1,000 | - | 21,000 |
| | ලාභාංශ | - | 4,000 | 25,000 |

ඉහත ඉදිරිපත් කර ඇති මුදල් පාලන ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ අප්‍රේල් 30 වන දිනට ශේෂය අසමාන වීමට හේතු දක්වා,

1. මුදල් පාලන ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම හා
2. බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙළ කරන්න.

## A පිළිතුර

බැංකු ප්‍රකාශනයේ හා මුදල් පාලන ගිණුමේ ශේෂය අසමාන වීමට බලපෑ කරුණු,

1. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත්

| | | | |
|---|---|---|---|
| චෙක් අංක | 241711 | රු. | 8,000 |
| චෙක් අංක | 281620 | රු. | 15,000 |

2. බැංකුවට සෘජුවම ලද ලාභාංශ රු. 4,000
3. නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත්

| | | | |
|---|---|---|---|
| චෙක් අංක | 211012 | රු. | 6,000 |
| චෙක් අංක | 211017 | රු. | 4,000 |

4. බැංකුව අය කරගත් චෙක්පොත් ගාස්තුව රු. 1,000
5. මුදල් ගෙවීම් ජර්නලයේ ගැනුම් තීරුවේ එකතුව රු. 10,000 මුදල් පාලන ගිණුමේ රු. 1,000 ක් ලෙස සටහන් වීම

**මුදල් පාලන ගිණුම සංශෝධනය කිරීම**

**මුදල් පාලන ගිණුම**

| | රු. | | රු. |
|---|---|---|---|
| ශේෂය | 44,000 | චෙක්පොත් ගාස්තුව | 1,000 |
| ලාභාංශ | 4,000 | ගැනුම් අඩුවීම | 9,000 |
| | | ශේ/ප/ගෙ | 38,000 |
| | **48,000** | | **48,000** |
| ශේ/ඉ/ගෙ | 38,000 | | |

**බැංකු සැසඳුම පිළියෙළ කිරීම**

**2018.04.30 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය**

| | රු. | රු. |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ සංශෝධිත ශේෂය | | 38,000 |
| **එකතු කළා:** | | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් | | |
| 211012 | 6,000 | |
| 211017 | 4,000 | 10,000 |
| | | 48,000 |
| **අඩු කළා:** | | |
| උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| 241711 | 8,000 | |
| 281620 | 15,000 | (23,000) |
| බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | | 25,000 |

## සාරාංශය


මූල්‍ය පාලනයන්
පාලන ගිණුම්
බැංකු සැසඳුම්
ණයගැති පාලන ගිණුම
ණයහිමි පාලන ගිණුම
ප්‍රති සටහන්
මුදල් පාලන ගිණුමේ බැංකු ශේෂය
බැංකු ප්‍රකාශනයේ බැංකු ශේෂය
වෙනස්කම්
ගළපන ලද මුදල් ගිණුම
බැංකු සැසඳුම් ප්‍රකාශය
පොදු ලෙජරය; ණයගැති පාලන ගිණුම
පොදු ලෙජරය; ණයහිමි පාලන ගිණුම
සැසඳුම
සැසඳුම
උපලෙජරය; පුද්ගලික ණයගැති ගිණුම්
උපලෙජරය; පුද්ගලික ණයහිමි ගිණුම්

## අභ්‍යාස

01) FG සමාගම 2018 ජූලි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කොට ඇති අතර එය පහත දක්වා ඇත.

| | | රු. |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ නිවැරදි ශේෂය | | 100,000 |
| **එකතු කළා:** | | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් -177261 | 8,000 | |
| -177265 | 10,000 | 18,000 |
| **අඩු කළා:** | | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| -152801 | 12,000 | 12,000 |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | 106,000 |

2018 අගෝස්තු 31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙල කරන ලද මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය සහ මුදල් පාලන ගිණුම පහත දැක්වේ.

### මුදල් ලැබීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක්පත් අංකය | වටිනාකම | විශ්ලේෂණ තීරු | |
|---|---|---|---|---|---|
| | | | | ණයගැති ලැබීම් | අත්පිට විකුණුම් |
| 8/5 | විකුණුම් | 400105 | 15,000 | | 15,000 |
| 8/11 | නලීන් | 210115 | 7,500 | 7,500 | |
| 8/30 | විකුණුම් | 256975 | 7,000 | | 7,000 |
| | | | **29,500** | **7,500** | **22,000** |

### මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | විස්තරය | චෙක් අංකය | වටිනාකම | විශ්ලේෂණ තීරු | | |
|---|---|---|---|---|---|---|
| | | | | විදුලිය | වැටුප් | ගැනුම් |
| 8/5 | විදුලි බිල | 177271 | 6,000 | 6,000 | | |
| 8/7 | වැටුප් | 177272 | 14,000 | | 14,000 | |
| 8/12 | ගැනුම් | 177273 | 2,000 | | | 2,000 |
| 8/31 | ගැනුම් | 177274 | 12,000 | | | 12,000 |
| | | | **34,000** | **6,000** | **14,000** | **14,000** |

### මුදල් පාලන ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| 8.1 | ශේෂය ඉ/ගෙ | 100,000 | 8.31 | විදුලිය | 6,000 |
| 8.31 | ණයගැති පාලන ගිණුම | 7,500 | 8.31 | වැටුප් | 14,000 |
| 8.31 | විකුණුම් | 22,000 | 8.31 | ණයහිමි පාලන ගිණුම | 14,000 |
| | | | 8.31 | ශේෂය ප/ගෙ | 95,500 |
| | | **129,500** | | | **129,500** |
| 9.1 | ශේෂය ඉ/ගෙ | 95,500 | | | |

අගෝස්තු මාසය සඳහා පහත බැංකු ප්‍රකාශනය බැංකුව විසින් එවා ඇත.

| පෙරමුණ බැංකුව | | | |
|---|---|---|---|
| බැංකු ප්‍රකාශනය - අගෝස්තු | | | රු. |
| | හර | බැර | ශේෂය |
| 01/08 ශේෂය | | | 106,000 |
| 01/08 ගෙවීම් 177261 | 8,000 | | 98,000 |
| 01/08 තැන්පතු 152801 | | 12,000 | 110,000 |
| 05/08 තැන්පතු 400105 | | 15,000 | 125,000 |
| 07/08 ගෙවීම් 177271 | 6,000 | | 119,000 |
| 09/08 ගෙවීම් 177272 | 14,000 | | 105,000 |
| 12/08 ගෙවීම් 177273 | 2,000 | | 103,000 |
| 13/08 තැන්පතු 210115 | | 7,500 | 110,500 |
| 31/08 බැංකු ගාස්තු | 250 | | 110,250 |

01) 2018 අගෝස්තු 31 දිනට ගලපන ලද මුදල් පාලන ගිණුම හා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන්න.

01) AGB සමාගම සතුව වාණිජ බැංකු 2 ක පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් 4 ක් ඇත. AGB සමාගමට සියළුම බැංකු ගිණුම් සඳහා එක් බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පමණක් පිළියෙල කළ හැකි ද?

## විසඳුම්

01)

### ගලපන ලද මුදල් පාලන ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 31/08 | ශේෂය | 95,500 | 31/08 | බැංකු ගාස්තු | 250 |
| | | | 30/08 | ශේෂය ප/ගෙ | 95,250 |
| | | 95,500 | | | 95,500 |

**බැංකු සැසඳුම් ප්‍රකාශය** රු.

| | | |
|---|---|---|
| මුදල් පාලන ගිණුමේ සංශෝධිත ශේෂය | | 95,250 |
| **එකතු කළා:** | | |
| ඉදිරිපත් නොකළ චෙක්පත් -177265 | 10,000 | |
| -177274 | 12,000 | 22,000 |
| **අඩු කළා:** | | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් | | |
| -210115 | 7,000 | 7,000 |
| බැංකු ප්‍රකාශයට අනුව ශේෂය | | 110,250 |

ජුලි මාසය තුළ ඉදිරිපත් නොවූ අංක 177265 දරණ චෙක්පත අගෝස්තු මාසය තුළද ඉදිරිපත් නොවී ඇති බව හඳුනා ගන්න. එම නිසා එය නැවතත් ඉදිරිපත් නොවූ චෙක්පතක් ලෙස අගෝස්තු මාසය තුළත් දැකිය හැකිය. එනමුත් චෙක්පත් අංක 177261 අගෝස්තු මාසය තුළ ඉදිරිපත් වී ඇති නිසා එය අගෝස්තු මාසයේ සැසඳුම තුළ දක්නට නොලැබේ. එමෙන්ම පසුගිය මස උපලබ්ධි නොවූ චෙක්පත් අගෝස්තු මාසය තුළ උපලබ්ධි වී ඇති නිසා එය අගෝස්තු මාසය සඳහා වූ සැසඳුමේ දක්නට නොලැබේ.

02) නැත. බැංකු සැසඳුමේ අරමුණ වනුයේ මුදල් ගිණුමට / මුදල් පාලන ගිණුමට අනුව හා බැංකුවට අනුව බැංකු ශේෂයන්ගේ වෙනස්කම් හඳුනා ගැනීමයි. මෙම අවස්ථාවේදී සමාගමට බැංකු ගිණුම් 4 ක් ලෙජරයේ පවත්වා ගත යුතු අතර බැංකු සැසඳුම් 4 ක් පිළියෙල කිරීම අවශ්‍ය වේ.